සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

### අවසාන වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ව්‍යාපාර සඳහා වර්තමාන සමාජයේ සුවිශේෂී වැදගත් කමක් හිමි වී ඇත. ඒ අනුව ව්‍යාපාර ආයතනයක් හැඳින්වීම සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය විය හැක්කේ,
    (1) භාණ්ඩ හා සේවා සපයන ඕනෑම අයාතනයකි.
    (2) ලාභ ලැබීමේ අරමුණෙන් කරන ඕනෑම ආයතනයකි.
    (3) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම කටයුත්තකි.
    (4) නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් මුණගැසෙන ඕනෑම ස්ථානයකි.

02. අවශ්‍යතා හා වුවමනා අතර ප්‍රධාන වෙනස දැක්වෙන ප්‍රකාශය වන්නේ,
    (1) අවශ්‍යතා පොදු වන අතර වුවමනා අත්‍යවශ්‍ය වේ.
    (2) අවශ්‍යතා පොදු වන අතර වුවමනා විවිධ වේ.
    (3) අවශ්‍යතා විවිධ වන අතර වුවමනා සීමිත වේ.
    (4) අවශ්‍යතා සීමිත වන අතර වුවමනා නිර්මාණය කළ නොහැකි වේ.

03. නිෂ්පාදන සාධක මූලික වශයෙන් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය ලෙස වර්ග කළ හැකිය. මෙහි ප්‍රාග්ධනය යන සාධකයට පමණක් අයත් වන දෑ වනුයේ,
    (1) යන්ත්‍ර සූත්‍ර, ඛනිජ සම්පත්, ගොඩනැගිලි, රථ වාහන
    (2) යන්ත්‍ර සූත්‍ර, කළමනාකරුවන්, ගොඩනැගිලි, රථ වාහන
    (3) යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, රථවාහන, මුදල්
    (4) කළමනාකරුවන්, ගොඩනැගිලි, රථවාහන, මුදල්

04. ඇල්මැති පාර්ශව වෙතින් ව්‍යාපාරය සඳහා විවිධ දායකත්වයන් අපේක්ෂා කරයි. ව්‍යාපාරයක් විසින් ශ්‍රම ඵලදායිතාව වැඩි කිරීමේ දායකත්වය අපේක්ෂා කරන්නේ කුමන පාර්ශවයෙන් ද?
    (1) අයිතිකරුවෝ (2) කළමනාකරුවෝ (3) සේවකයෝ (4) සැපයුම්කරුවෝ

05. ව්‍යාපාරයක් කෙරෙහි බලපාන "තාක්ෂණ දැනුම යාවත් කාලීන නොවීම" යන කරුණු එම ව්‍යාපාරයට ඇති.
    (1) ශක්තියකි. (2) දුර්වලතාවයකි (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

06. පෞද්ගලික අංශය හා පොදු අංශය යනුවෙන් ව්‍යාපාර සංවිධාන වර්ග කරනු ලබන පදනම වනුයේ,
    (1) හිමිකාරත්වය අනුවය (2) අරමුණු අනුවය
    (3) පරිමාණය අනුවය (4) නිෂ්පාදනය අනුවය

07. ආර්ථික පරිසරයට අයත් සාධක ඇතුලත් කාණ්ඩය වන්නේ,
    (1) සිරිත් විරිත්, උද්ධමනය, පොලී අනුපාත, ජීවන වියදම
    (2) මිල මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය, පොලී අනුපාත, වැටුප් වට්ටම්
    (3) මිල මට්ටම, උද්ධමනය, පොලී අනුපාත, වැටුප් වට්ටම
    (4) නීති රීති, වැටුප් මට්ටම, ජීවන වියදම, පොලී අනුපාත

08. ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන ලෙස දැක්විය හැක්කේ,
    (1) සංස්ථා හා සමිති සංවිධාන (2) සංස්ථා හා දෙපාර්තමේන්තු
    (3) සංස්ථා හා සමුපකාර (4) සමුපකාර හා සමිති සංවිධාන

09. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් නොවන ව්‍යාපාර සංවිධානයක් වනුයේ,
    (1) සංස්ථාපිත සමාගම් (2) සමුපකාර සමිති
    (3) හවුල් ව්‍යාපාර (4) රාජ්‍ය සමාගම්

10. ස්වාධීනව කටයුතු කිරීමට කැමති කම දක්ෂතාවය හා කැපවීම මත සාර්ථකත්වය ලබා ගත හැකි ව්‍යාපාර සංවිධානයක් වනුයේ,
    (1) ඒක පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර
    (3) සංස්ථාපිත සමාගම් (4) සමිති සංවිධාන

11. ව්‍යාපාර සංවිධාන සැලකීමේ දී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇති ව්‍යාපාර සංවිධානය වනුයේ.

(1) සංස්ථාපිත සමාගම් (2) රාජ්‍ය සංස්ථා

(3) සමුපකාර සමිති (4) හවුල් ව්‍යාපාර

12. සීමා සහිත සමාගම් වල පමණක් දැකිය හැකි වාසි පමණක් අයත් පිළිතුර වන්නේ,

(1) වගකීම සීමිතවීම හා අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

(2) නෛතික පුද්ගලභාවයක් පැවතීම හා අසීමිත වගකීමක් පැවතීම.

(3) ලියාපදිංචිය අනිවාර්ය නොවීම හා වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.

(4) නෛතික පුද්ගලභාවයක් පැවතීම හා වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.

13. ඒක පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමෙන් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතු වේ. ව්‍යාපාර නම ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ,

(1) අයිතිකරුය. (2) අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ය.

(3) ග්‍රාමනිලධාරිවරයා ය. (4) අදාළ පළාත් සභාවේ ප්‍රාදේශීය ලේකම්වරයා ය.

14. හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1000 හෝ ඊට වඩා වැඩි නම් ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගෙන යා යුතු බව සඳහන් වන්නේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුවය

(2) වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුවය

(3) 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුවය

(4) 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතට අනුවය

15. ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියා පදිංචි කිරීම තුළින් අත්කර ගත හැකි ප්‍රතිලාභයක් වන්නේ,

(1) සියලු ලාභ අත්පත් කර ගත හැකි වීමය.

(2) ආදායම් බදුවලින් නිදහස් වීමය.

(3) ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීමය.

(4) ව්‍යාපාරයට අනන්‍යතාවක් ලැබීමය

16. පහත සඳහන් තොරතුරු සලකා බලා වත්කමක ලක්ෂණ පමණක් ඇතුලත් වන පිළිතුර තෝරන්න.

A අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම

B වර්තමාන බැඳීමක් තිබීම

C ව්‍යාපාරයේ පාලනයට යටත් වීම

D අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

E බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම

(1) A, C සහ D (2) A, B හා C (3) B, C හා E (4) A, D හා E

17. ඉහත 16 වන ප්‍රශ්නයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු උපයෝගී කර ගෙන වගකීමක් පමණක් ඇතුලත් වන ලක්ෂණ ඇති පිළිතුර තෝරන්න.

(1) A, B හා E (2) A, B හා D (3) B, C හා D (4) B, C හා E

18. ජංගම වගකීක් නොවන්නේ කුමක් ද?

(1) ණය හිමියෝ (2) බැංකු අයිරාව

(3) බැංකු ණය (4) ගෙවිය යුතු වියදම්

19. ව්‍යාපාරයක මූලික ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ප්‍රාග්ධනය සෙවීමට අදහස් කරයි නම් ප්‍රාග්ධනය සෙවිය හැකි වන්නේ,

(1) මුළු වත්කම් + මුළු වගකීම් (2) මුළු වත්කම් මුළු වගකීම්

(3) මුළු වගකීම් මුළු වත්කම් (4) මුළු වගකීම් ÷ මුළු වත්කම්

20. ව්‍යාපාරය රු. 25000/ ක බැංකු ණයක් ලබා ගත්තේ නම් එය මූලික ගිණුම්කරණ සමීකරණයට බලපාන්නේ කෙසේ ද යන්න නිරූපණය කෙරෙන පිළිතුර වන්නේ,

| | වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 25 000 | = | 25 000 | | |
| (2) | 25 000 (25 000) = | | | | |
| (3) | 25 000 | = | | + | 25 000 |
| (4) | (25 000) | = | 25 000 | | |

21. ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම අඩු වීමට බලපාන ගනුදෙනුව වනුයේ,

(1) රු. 50000 ක මුදලක් අමතර ප්‍රාග්ධනය ලෙස යෙදීම

(2) රු. 50000 ක බැංකු ණයක් ගැනීම

(3) රු. 50000 ක අමතර ආදායම් ලැබීම

(4) රු. 50000 ක විදුලි වියදම් ගෙවීම

22. රු. 24000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන දැක්වෙනුයේ,
(1) ගැනුම් ගිණුම හර මුදල් ගිණුම බැර
(2) මුදල් ගිණුම හර ගැනුම් ගිණුම බැර
(3) ගැනුම් ගිණුම හර අදාළ ණය හිමි ගිණුම බැර
(4) අදාළ ණය හිමි ගිණුම හර ගැණුම් ගිණුම බැර

23. ව්‍යාපාරයක ලෙජරයක් යනුවෙන් අදහස් වනුයේ,
(1) මුදල් සටහන් ඇතුලත් පොතකි
(2) ලෙජර් ගිණුමේ සියල්ලේ එකතුවයි
(3) ව්‍යාපාරයක් භාවිතා කරන මූලික සටහන් පොතකි
(4) ව්‍යාපාරයක ණය ගනුදෙනු සියල්ල ඇතුලත් පොතකි

24. ව්‍යාපාරයක් එහි නිෂ්පාදන කටයුතු සඳහා රු 80000 කට ණයට ගන්නා ලද යන්ත්‍රයක් සම්බන්ධ ගනුදෙනුව ඇතුලත් කිරීමට යොදාගන්නා මූලික සටහන් පොත වනුයේ,
(1) මුදල් පොතයි (2) ගැනුම් ජ'නලයයි
(3) විකුණුම් ජ'නලයයි (4) පොදු ජ'නලයයි

25. ව්‍යාපාරයක් භාවිතයට ගන්නා උපයෝගී පොත් කිහිපයක් හා ඒවා සඳහා භාවිතයට ගන්නා මූලාශ්‍ර ලේඛන කිහිපයක් පහත දැක්වේ. එම මූලික සටහන් පොතට අදාළ මූලාශ්‍ර ලේඛණය ගැළපූ විට දැක්වෙන නිවැරදි පිළිතුර වනුයේ,

| | මූලික සටහන් පොත | | මූලාශ්‍ර ලේඛණ |
|---|---|---|---|
| A | මුදල් පොත | 1 | ලදුපත / ගෙවීම් වවුචරය |
| B | ගැනුම් ජ'නලය | 2 | විකුණුම් ජ'නලය |
| C | විකුණුම් ජ'නලය | 3 | බැර පතයි |
| D | ආපසු එවුම් ජ'නලය | 4 | ගැනුම් ජ'නලයයි |

(1) A-1, B-4, C-2, D-3 (2) A-4, B-3, C-1, D-2
(3) A-4, B-2, C-3, D-1 (4) A-1, B-2, C-4, D-3

26. අයිතිකරු රු. 50000 ප්‍රාග්ධනය යෙදීම නිසා
(1) වත්කම් හා වගකීම් වැඩිවේ (2) වත්කම් හා හිමිකම් වැඩිවේ
(3) වත්කම් වැඩි වී වගකීම් අඩුවේ (4) වත්කම් හා හිමිකම් අඩුවේ

27. කිසියම් භාණ්ඩයක් මිලදී ගන්නා අවස්ථාවේදී ම දෙනු ලබන වට්ටමකි.
(1) දුන් වට්ටම් (2) ලද වට්ටම් (3) වෙළඳ වට්ටම් (4) මුදල් වට්ටම්

28. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම ලෙස හැඳින්වෙන්නේ,
(1) ප්‍රධාන මුදල් භාරකරු මාසය තුළ සුළු මුදල් වියදම් දැරීමට යම් මුදලක් ලබා දීමය
(2) සුළු මුදල් භාරකරුට මාසයේ වියදම් කළ මුදලට සමාන මුදලක් ලබා දී අදාළ සුළු මුදල් ප්‍රමාණය සම්පූර්ණ කිරීමය.
(3) සුළු මුදල් භාරකරු මාසය අවසානයේ ඉතිරි මුදලට සමාන මුදලක් ලබා දීමය.
(4) මාසයේ ආරම්භයේ එකඟ වූ මුදල සුළු මුදල් භාරකරුට ලබා දීමය.

29. ණය හිමියකුට ව්‍යාපාරයෙන් ලබා දුන් චෙක් පතක් අගරු වූ විට එම අගරු වීම සටහන් කළ යුතු නිවැරදි සටහන වනුයේ,
(1) බැංකු ගිණුම හර අදාළ ණය හිමි ගිණුම බැර
(2) මුදල් ගිණුම හර මුදල් ගිණුම බැර
(3) අදාළ ණය හිමි ගිණුම හර බැංකු ගිණුම බැර
(4) මුදල් ගිණුම හර අදාළ ණය හිමි ගිණුම බැර

30. ව්‍යාපාරයේ දැක්වෙන බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමට ඇතුලත් කර ගන්නා තොරතුරු පමණක් අයත් වන පිළිතුර වන්නේ,
(1) තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත්, සෘජු ප්‍රේෂණ ස්ථාවර නියෝග
(2) සෘජු ප්‍රේෂණ ලැබීම්, ස්ථාවර නියෝග මත ගෙවීම්, බැංකු ගාස්තු
(3) සෘජු ප්‍රේෂණ ලැබීම්, නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්, බැංකු ගාස්තු
(4) තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත්, බැංකු ගාස්තු

31. බැංකු ගිණුම් විස්තරයේ සඳහන් ශේෂයට වඩා වැඩි ශේෂයක් මුදල් පොතේ පෙන්වීමට හේතුවක් වන්නේ,
(1) ව්‍යාපාරය වෙනුවෙන් කෙලින්ම බැංකුවට යැවූ චෙක්පත්ය.
(2) ගනුදෙනු කරුවන් කෙළින්ම බැංකුවට යැවූ චෙක්පත් ය.
(3) තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවූ චෙක්පත්ය.
(4) නිකුත් කළ චෙක්පතක් බැංකුවට ඉදිරිපත් නොවීමය.

32. ලෙජර් ගිණුමක් හා උපයෝගී පොතක් යන ද්විත්ව කාර්ය ඉටු කරන මූලික සටහන් වනුයේ,
(1) ගැනුම් ජ'නලයයි. (2) පොදු ජ'නලයයි.
(3) මුදල් පොතයි. (4) සුළු මුදල් පොතයි.

33. ගැනුම් ජ'නලයක සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් වන ආකාරය දක්වෙන සටහන වනුයේ, පිළිවෙලින් ගැනුම් ජ'නලයේ එකතුව හා ගැනුම් ඉන්වොයිසි වල ශුද්ධ අගය
(1) ගැනුම් ගිණුම හර අදාළ ණය හිමියන්ගේ ගිණුම් වලට බැර
(2) අදාළ ණය හිමියන්ගේ ගිණුම් වලට හර ගැනුම් ගිණුම බැර
(3) අදාළ ණය හිමියන්ගේ ගිණුම් වලට හර මුදල් පොත බැර
(4) මුදල් පොත හර අදාළ ණය හිමියන්ගේ ගිණුම් වලට බැර

34. ව්‍යාපාරයක විකුණුම් ජ'නලයක සටහන් කරන ගනුදෙණුවක් වන්නේ,
(1) ව්‍යාපාරයේ වෙළඳ බඩු තොගයක් රු. 5000 ක අත්පිට මුදලට විකිණීම
(2) ව්‍යාපාරයේ ඇති ලී බඩු උපකරණ රු. 8000 ක ණයට විකිණීම
(3) ව්‍යාපාරයේ ඇති වෙළඳ බඩු කොගයක් රු. 4000 ක ණයට විකිණීම
(4) ව්‍යාපාරයේ පාවිච්චි කළ යන්ත්‍ර උපකරණ රු. 10000 ක ණයට විකිණීම.

35. අනෙකුත් උපයෝගී පොත්වල සටහන් නොවන ගනුදෙනු මුලින්ම සටහන් කරන මූලික සටහන් පොත වනුයේ,
(1) ලෙජරයයි (2) පොදු ජ'නලයයි (3) මුදල් පොතයි (4) බැංකු ගිණුමයි.

36. ගනුදෙනු කරුවකුට දුරකථන බැංකු සේවා පහසුකම් යටතේ විවිධ කාර්ය ඉටු කර ගත හැකි වන අතර එවැනි කාර්යයන් විය නොහැක්කේ,
(1) බැංකු ගිණුමේ ශේෂය පිරික්සුම
(2) විදුලි බිල්පත්, ජල බිල්පත් ගෙවීම.
(3) ගිණුමකින් තවත් ගිණුමකට මුදල් මාරු කිරීම
(4) බැංකු සැසඳුම් ලබාගැනීම.

37. පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමක ''හර'' හා ''බැර'' තීරුවල එකතු සමාන වීම තුළින් අනාවරණය වන්නේ,
(1) ගනුදෙනු සියල්ල නිවැරදිව සටහන් කර ඇති බවය.
(2) ගනුදෙනු සටහන් කිරීමේ ගණිතමය නිවැරදිතාව හරි බවය.
(3) ගණුදෙනු සටහන් තැබීමේ දී වැරදි සිදු වී ඇති බවය.
(4) ඉහත සියල්ලම නිවැරදි බවය.

38. ශේෂ පිරික්සුම තුළින් හෙලිදරව් නොවන වරදක් වන්නේ,
(1) රු 1000 විදුලි බිල ගෙවීම මුදල් පොතේ බැර පැත්තේ සටහන් කර ඇතත් වෙනත් කිසිදු සටහනක් නොවීම.
(2) චාමරගෙන් ලැබුණු රු. 450 මුදල්, මුදල් පොත හර රු. 450 ද චාමරගේ ගිණුමට රු. 540 ලෙස සටහන් කිරීම.
(3) රු. 5000 වටිනා ලී බඩු මිලදී ගැනීම රු. 50000 ලෙස ගිණුම් වල සටහන් කිරීම.
(4) රු. 2000 වූ විකුණුම් රු. 2200 ලෙස විකුණුම් ගිණුමට බැර කිරීම.

39. ''අවිනිශ්චිත ගිණුම'' සම්බන්ධ වැරදි ප්‍රකාශය වනුයේ,
(1) ශේෂ පිරික්සුමේ වෙනස තාවකාලිකව සටහන් කරන ගිණුමයි.
(2) ශේෂ පිරික්සුමේ වෙනස ඇති වීමට බලපාන වැරදි නිවැරදි කරන ගිණුමයි.
(3) ශේෂ පිරික්සුමේ වෙනසට හේතු වූ වැරදි නිවැරදි කළ පසු මෙම ගිණුමේ ශේෂය ද ඉවත් ව යා යුතුය.
(4) මෙම ගිණුම තාවකාලිකව ඇති කරන ගිණුමකි.

40. යන්ත්‍ර අළුත්වැඩියා වියදම රු. 5000 යන්ත්‍ර ගිණුමට හර කිරීම වරද නිවැරදි කිරීමේ සටහන වනුයේ,
(1) යන්ත්‍ර ගිණුම හර යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම බැර
(2) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර යන්ත්‍ර ගිණුම බැර
(3) අවිනිශ්චිත ගිණුම හර යන්ත්‍ර ගිණුම බැර
(4) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර මුදල් පොත බැර (ල. 1x40 = 40)

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු වන කොටස අනිවාර්යය වේ. A කොටසින් ප්‍රශ්න 2 ක් ද, B කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. ස්වභාව ධර්මයට බෙහෙවින් ඇලුම් කළ කෝසල කෘෂිවිද්‍යා අංශයෙන්ම උසස් පෙළ හදාරා විශ්ව විද්‍යාල අධ්‍යාපනයට උරුමකම් කීමට නොහැකි වූ දරුවෙකි. උසස් පෙළින් පසු කලක් පැල තවානක සේවය කළේය. බෙහෙවින් ඇලුම් කළ මෙම කාර්යයට එහි කටයුතු මැනවින් ඉගෙන ගනු ලැබූයේ ඔහු සිත තුළ තිබූ ව්‍යාපාරික අදහස ක්‍රියාවට නැංවීමටය. ප්‍රධාන පාරට මායිම්ව පිහිටි ඔහුගේ ඉඩම මේ අදහස තවත් වැඩි කිරීමට හේතු විය. ඒ අනුව ''උදාහිරු'' පැල තවානේ ආරම්භයට අඩිතාලම වැටුනි. ඒ සඳහා තම වැඩිමල් සොහොයුරියගෙන් ඉල්ලා ගත් රු. 90000 මුදලක් සහ තමා රැකියාවෙන් උපයා ගත් රු. 60000 මුදලක් යෙදවූ අතර අනිත් කටයුතු සඳහා රු. 50000 මහජන බැංකුවෙන් ණය මුදලක් ලෙස ලබා ගන්නා ලදී. ව්‍යාපාරික කටයුතු පහසු කර ගැනීම සඳහා මහජන බැංකුවෙහි ජංගම ගිණුමක් ආරම්භ කිරිමට ද කටයුතු සලසා ගෙන ඇත.

(1) කෝසල ආරම්භ කළ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානායකට අයත්වේද? එම සංවිධාන ක්‍රමයේ පවතින වාසි දෙකක් සඳහන් කරන්න.

(2) එම සංවිධාන ක්‍රමයේ අවාසි පවතී ද ? එසේ නම් ඒවා දෙකක් නම් කරන්න. එම අවාසි මඟ හැරවීමට ඔහුට පවත්වාගෙන යා හැකි වෙනත් ව්‍යාපාර දෙකක් නම් කරන්න.

(3) මෙම ව්‍යාපාරය ලියා පදිංචි කිරීම අවශ්‍යය ද? ලියාපදිංචි කළ යුතු නම් එහි බලධාරියා වනුයේ කවුරුන් ද?

(4) ව්‍යාපාර නාමය ලියා පදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

(5) කෝසලගේ මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් පැවතිය හැකි ශක්ති දෙකක් හා දුර්වලතා දෙකක් සඳහන් කරන්න.

(6) මෙම ව්‍යාපාරයේ ආරම්භක ගනුදෙනු වත්කම් = හිමිකම් + වගකීම් යන සමීකරණයට ලියා දක්වන්න.

(7) මෙම ව්‍යාපාරයේ මුදල් ගනුදෙනු හා බැංකු ජංගම ගිණුම සම්බන්ධ ගනුදෙනු වාර්තා කිරීමට යොදා ගන්නා මූලික සටහන් පොත් මොනවාද? එම ගනුදෙනු ඇතුලත් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන මොනවාද?

(8) කෝසල ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීමට සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අයකු සොයමින් පසුවේ. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

(9) මෙම ව්‍යාපාරයෙහි ආරම්භක තොරතුරු වලින් දැකිය හැකි ජංගම නොවන වත්කමක් සහ ජංගම වත්කමක් සඳහන් කරන්න.

(10) ගනුදෙනු සිදු වී මාසය අවසානයේ බැංකු ගනුදෙනු හා මුදල් ගනුදෙනු බැලීමේදී බැංකුවේ ජංගම ගිණුමේ ශේෂයට වඩා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය වැඩි බව අනාවරණය විය. එසේ සිදුවිය හැකි ද? එසේ නම් එයට බලපෑ හැකි හේතු දෙකක් සඳහන් කරන්න. (ල. 2 x 10 = 20)

## A කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (1) මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුන්වන්න. අවශ්‍යතා වල ලක්ෂණ දෙකක් සහ වුවමනා වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(2) භාණ්ඩ සම්බන්ධයෙන් පැවතිය හැකි ලක්ෂණ දෙකක් සහ සේවා සම්බන්ධයෙන් පැවතිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(3) ඔබට හමුවන භාණ්ඩ සැපයීමේ ව්‍යාපාර දෙකක් සහ සේවා සැපයීමේ ව්‍යාපාර දෙකක් නම් කරන්න.

(4) ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශවයන් වශයෙන් කටයුතු කරන අයිතිකරුවෝ සහ කළමනාකරුවෝ යන පාර්ශව දෙක වෙතින් ව්‍යාපාරය අපේක්ෂා කරන දායකත්වයන් දෙක බැගින් ලියන්න.

(5) ව්‍යාපාර පරිමාණය අනුව වර්ග කිරීමේ දී සලකා බලනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායකයන් දෙකක් සඳහන් කරන්න. (ල. 2 x 5 = 10)

03. ව්‍යාපාර පවත්වාගෙන යන්නන් අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක පිළිබඳ අවධානයෙන් සිටීම වැදගත් වේ.

(1) අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශව දෙකක් සහ බාහිර පරිසරයට අයත් වන පාර්ශව දෙකක් බැගින් ලියන්න.

(2) බාහිර පරිසරය තුළින් හඳුනාගත හැකි ව්‍යාපාර අවස්ථා හා තර්ජන දෙක බැගින් ලියන්න.

(3) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහාත්, ව්‍යාපාර ආරක්ෂා කිරීම සඳහාත් විවිධ අණ පනත් පනවා ඇති අතර ඒවා ක්‍රියාත්මක කරන ආයතන පවතී. එවැනි ආයතන දෙකක් නම් කරන්න.

(4) ආර්ථික පරිසර සාධක හතරක් නම් කරන්න.

(5) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් 02 ක් නම් කරන්න. (ල. 10)

04. (1) සමුපකාර සමිති සම්බන්ධයෙන් පවතින ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(2) අනෙකුත් ව්‍යාපාර සංවිධාන වලට සාපේක්ෂව රජයේ දෙපාර්තමේන්තු වල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(3) වර්තමානයේ බොහෝ වාණිජ බැංකු ටෙලි බැංකු සේවා පවත්වා ගෙන යනු ලබයි. ව්‍යාපාරිකයකුට මේ තුළින් ඉටු කරවා ගත හැකි කාර්යන් දෙකක් ලියන්න.

(4) ජංගම දුරකථන බැංකුකරණය වර්තමානයේ ඉතා ඉහළ මට්ටමකින් ව්‍යාප්ත වීමට බලපාන වාසි දෙකක් නම් කරන්න.

(5) වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ඒවායේ ගිණුම්කරණ කටයුතු පරිගණක ගත කිරීම සිදු කර ඇත. මෙම පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ පැවතිය හැකි අවාසි දෙකක් ලියා දක්වන්න. (ල. 10)

## B කොටස - ගිණුම්කරණය

05. (අ) පහත දැක්වෙන්නේ බිනරගේ ව්‍යාපාරයට 2015 ජනවාරි මාසයට අදාළ ගනුදෙනුය. එම ගනුදෙනු වල බලපෑම පහත ආකෘතියට අනුව දක්වන්න.

| වත්කම් = හිමිකම් + වගකීම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| ලීබඩු උපකරණ | + භාණ්ඩ තොගය | + ණය ගැතියෝ | + මුදල් | හිමිකම් | + බැංකු ණය | + ණය හිමියෝ |
| | | | | | | |

(1) අයිතිකරු ප්‍රාග්ධනය යෙදුවා රු. 300000

(2) භාණ්ඩ තොගයක් මිලට ගත්තා රු. 20000 (ල.02)

(3) ලී බඩු උපකරණ ගත්තා රු. 50000

(4) රු. 8000 පිරිවැය වූ භාණ්ඩ අත්පිට වික්කා රු. 15000

(5) රු. 40000 වූ බඩු තොගයක් ණය පදනම මත ගත්තා

(6) රු. 50000 ක බැංකු ණයක් ලැබුණා

(7) රු. 10000 පිරිවැය වූ භාණ්ඩ ණයට වික්කා රු. 18000

(8) ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 5000

(9) බිනරගේ නිවසේ විදුලි බිල ගෙව්වා රු. 3000

(10) ණය ගැතියන්ගෙන් මුදල් ලැබුණා. රු. 10000 (ල. 05)

(ආ) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් පහත දක්වා ඇත.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| I. | වැඩිවීම, අඩුවීම | | | | |
| II. | අඩුවීම | = | අඩුවීම | | |
| III. | අඩුවීම | = | | + | අඩුවීම |

ඉහත සිදුවේ යැයි සිතිය හැකි ගනුදෙනුව බැගින් ලියන්න. (ල.03)

(ඇ) පහත වගුව සම්පූර්ණ කරන්න.

| මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛණ |
|---|---|
| සුළු මුදල් පොත | |
| පොදු ජ'නලය | |

06. (අ) පහත සඳහන් තොරතුරු පිටි ග්ලාස් හවුස් ව්‍යාපාරයට අදාළවේ. එම තොරතුරු ඇසුරෙන් ගැනුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

2015 04 01 ඉන්වොයිසි අංක 201 න් ප්‍රියන්තගෙන් මිලදී ගත් භාණ්ඩ වල ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම 12000

2015 04 07 ඉන්වොයිසි අංක 83 න් ලහිරුගෙන් මිලදී ගත් භාණ්ඩ වල ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම රු. 8000

2015 04 20 ඉන්වොයිසි අංක 101 න් ඉසුරුගෙන් මිලදී ගත් භාණ්ඩ වල ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම රු. 16000

2015 04 23 ඉන්වොයිසි අංක 108 න් රනිල්ගෙන් මිලදී ගත් භාණ්ඩ වල ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම රු. 11000 (ල. 05)

(ආ) 2015 05 08 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 20000 වටිනා ලී බඩු සීමා සහිත කුරේ සහ සමාගමෙන් ණයට ගත්තා

ඉහත සඳහන් ගනුදෙනුව පොදු ජ'නලයේ ලියා දක්වන්න. (ල. 02)

(ඇ) 2015 ජනවාරි 31 දිනට සීමිත ආලෝකා සමාගමේ ලෙජර් ගිණුම් තුලනය කිරීමෙන් පසු ගිණුම් ශේෂ පහත පරිදි දක්වා ඇත. ඒවා ඇසුර කර ගෙන ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

| | |
|---|---|
| ගැනුම් | 50 000 |
| විකුණුම් | 120 000 |
| ප්‍රාග්ධනය | 200 000 |
| ණය ගැතියෝ | 30 000 |
| ණය හිමියෝ | 10 000 |
| ලී බඩු | 20 000 |

| | | |
|---|---|---|
| මෝටර් රථය | 165 000 | |
| විදුලිය ගෙවීම් | 4 000 | |
| ලද වට්ටම් | 2 000 | |
| දුන් වට්ටම් | 3 000 | (ල. 03) |

07. (අ) (1) 2015 06 30 දිනට සකස් කළ කපිලගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්ෂුම සම නොවූ හෙයින් එහි වෙනස වූ රු. 2980/ අවිනිශ්චිත ගිණුමේ බැරට සටහන් කරන ලදී. පසුව පහත වැරදි සොයා ගන්නා ලදී.

(2) විකුණුම් ගිණුමේ එකතුව රු. 1000/ ක් අඩුවෙන් සටහන් කර ඇත.

(3) රත්නට ගෙවූ රු. 800 ක් රමණිගේ ගිණුමට හර කර ඇත.

(4) රු. 10,000/ ක ලී බඩු මිලදී ගැනීමක් ලී බඩු අළුත්වැඩියා ගිණුමට හර කර ඇත.

(5) ආපසු එවුම් ජ'නලයේ එකතුව රු. 6080 හෝ ආපසු එවුම් ගිණුමට මාරු කර තිබුනේ රු. 8060 ක් ලෙසටය. අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් හා

(ආ) අවිනිශ්චිත ගිණුම. (ල. 05)

(ආ) 2015 අගෝස්තු 31 දින රූපසිරිගේ ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු ශේෂය රු.12800 ක් විය. එම මාසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයනයේ ශේෂයට මුදල් පොතේ ශේෂය අසමාන විය. වෙනසට හේතු සෙවීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) අගෝස්තු මාසයේ දී තැන්පත් කළ නමුත් එම මාසය තුළ දී උපලබ්ධි නොවූ චෙක්පත්

වාසනාගෙන් ලද රු. 2500/ චෙක්පත

බන්දුලගෙන් ලද රු. 3200 චෙක්පත

(2) සැප්තැම්බර් මාසයේදී ලියන ලද නමුත් එම මාසය තුළ බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්

චෙක්පත් අංක 20023 රු 3000/

චෙක්පත් අංක 21400 රු. 1200

(3) බැංකු ගිණුමට හර කළ නමුත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ රක්ෂණ වාරිකය රු. 1200 කි.

බැංකු ගාස්තු රු. 250 කි.

ව්‍යාපාරයට ලැබිය යුතු රු. 5000 ලාභාංශයක් කෙලින්ම බැංකු ගිණුමට ලැබී තිබුණි.

අවශ්‍ය වන්නේ බැංකු ගිණුම සංශෝධනය කිරීම.

බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය ගෙන බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම. (ල. 05)

The National e-learning Portal for The General Education